පළමු වාර පරීක්ෂණය - 2012
බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

11ශ්‍රේණිය | නර්තනය | කාලය :- පැය 2 යි.

නම :- .................................... ඇ.අංකය :- .......................... පංතිය :- ...........

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා ඔබට දී ඇති පිළිතුරු පත්‍රයේ අදාළ කවය මත කතිර ලකුණ යොදන්න.

1. උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම ලෙස හැඳින්විය හැකිය.

   (i) කොහොඹාකංකාරිය, රිද්දියාගය හා දෙවොල් මඩුව
   (ii) කොහොඹාකංකාරිය, දෙවොල් මඩුව හා පහන් මඩුව
   (iii) කොහොඹාකංකාරිය, පහන් මඩුව හා සන්නියකුම
   (iv) කොහොඹාකංකාරිය, පහන් මඩුව හා දහඅට සන්නිය

2. පහත රට නර්තන සම්ප්‍රදාය ............................ ප්‍රධාන වශයෙන්,

   (i) මාතර, බෙන්තර හා රයිගම සම්ප්‍රදාය යනුවෙන් හැඳින්වේ.
   (ii) මාතර, කළුතර හා බෙන්තර සම්ප්‍රදාය යනුවෙන් හැඳින්වේ.
   (iii) මාතර, ගාල්ල හා රයිගම සම්ප්‍රදාය යනුවෙන් හැඳින්වේ.
   (iv) මාතර, ගාල්ල හා බෙන්තර සම්ප්‍රදාය යනුවෙන් හැඳින්වේ.

3. රන් දහඩිය බිංදු බිංදු - ඉසුරු සුවඳ රැන්දූ රැන්දූ යන ගීතය වඩා සුදුසු වන්නේ ....................... චලන නිර්මාණයටයි.

   (i) ප්‍රකාශනාත්මක (ii) රිද්මයානුකූල
   (iii) තාලානුකූල (iv) අභිචලන

4. පහතරට නර්තන සම්ප්‍රදායේ මූලික අභ්‍යාස හඳුන්වන්නේ,

   (i) පා සරඹ (ii) ඉලංගම් සරඹ
   (iii) දෙඕින පද (iv) ගොඩ සරඹ

5. නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගතහැකි ග්‍රන්ථ දෙකකි.

   (i) ලෝවැඩ සඟරාව හා මහාවංශය (ii) මහාවංශය හා සිරිත්මල්දම
   (iii) මහාවංශය හා ගැමි නාටකය (iv) මහාවංශය හා කුවේණි අස්න

6. නර්තන කලාව පිළිබඳ තොරතුරු ලියවුණු ලෙන්ලිපි දක්නට ලැබෙන්නේ....................

(i) අනුරාධපුර යුගයේ (ii) ගම්පල යුගයේ

(iii) මහනුවර යුගයේ (iv) දඹදෙණි යුගයේ

7. මාත්‍රා 3 + 4 දෙතිතට නැටිය හැකි වන්නමකි,

(i) සැවුලා වන්නනම (ii) නෛයිඅඩි වන්නම

(iii) සිංහරාජ වන්නම (iv) වෛරෝඩි වන්නම

8. සිංහල ගැමි නැටුමක් වන ලී කෙළි නැටුම හා සමාන ද්‍රවිඩ ගැමි නැටුමකි.

(i) තාලම් (ii) ඉල තාලම් (iii) කයිතාලම් (iv) කෝලාට්ටම්

9. දොං දොංජිං ජිං ගජිගත ..................... මෙම බෙරපදයේ සමස්ත මාත්‍රා සංඛ්‍යාව,

(i) 12 කි (ii) 14 කි. (iii) 10 කි. (iv) 11 කි.

10. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රශස්ති බිහිවූවා යැයි සැලකේ.

(i) දඹදෙණි යුගයේ (ii) කුරුණෑගල යුගයේ

(iii) මහනුවර යුගයේ (iv) ගම්පල යුගයේ

11. රබාන, ගැටබෙරය, දවුල........ මෙම භාණ්ඩ පංචතූර්ය වර්ගීකරණය අනුව අයත් වන්නේ,

(i) විතතාතත හා විතත (ii) ආතත හා විතත

(iii) විතත හා විතතාතත (iv) ආතත හා විතතාතත

12. හේවිසි වාදනය සඳහා යොදාගන්නා සුෂිර භාණ්ඩයකි.

(i) බටනලාව (ii) හොරණෑව

(iii) කොම්බුව (iv) වස්දඬුව

13. ගැමි නැටුම් අංගවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි.

(i) ඉතා සංකීර්ණ බව හා සාමූහික බව (ii) වාද්‍ය භාණ්ඩ වැඩි ප්‍රමාණයක් වාදනය කිරීම.

(iii) මිහිරි ගායනා අඩංගු වීම (iv) ඉතා සරල වීම හා සාමූහික බව

14. ග්‍රහ ප්‍රභේද යනුවෙන් හඳුන්වයි.

(i) සුළු, මැදුම්, මහ තනිතිත් (ii) තනි තිත, දෙතිත, තුන්තිත

(iii) සම ග්‍රහ, අව ග්‍රහ, විෂම ග්‍රහ (iv) විලම්භ, මධ්‍ය, ද්‍රැත

15. උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන් තුනෙහි වන්නම් සංඛ්‍යාව පිළිවෙලින්,

(i) 18, 32, 18 (ii) 18, 18, 32 (iii) 32, 18, 18 (iv) 32, 18, 24

16. ආදේශ භාණ්ඩ යනුවෙන් හඳුන්වන්නේ...........

(i) සම්වර්ග උපයෝගී කරගනිමින් වාදනය සඳහා නිපදවා ඇති භාණ්ඩ
(ii) සම්ප්‍රදායික භාණ්ඩ වෙනුවට යොදාගත හැකි භාණ්ඩ
(iii) අපතේ යන ද්‍රව්‍ය වලින් සැකසූ භාණ්ඩ
(iv) ඉතා මිහිරි හඬින් යුත් භාණ්ඩ

17. වෙනිවර කැරැල්ල හා වරපටි දක්නට ලැබෙන්නේ,

(i) ගැටබෙරයේ හා යක්බෙරයේ (ii) ගැටබෙරයේ හා දවුලේ
(iii) දවුලේ හා පහතරට බෙරයේ (iv) දවුලේ හා බුම්මැඩියේ

18. සිරසේ සිට පාදාන්තය දක්වා දොස් දුරුකිරීමට ගයන කවි,

(i) ග්‍රහ පන්ති කිව (ii) මල් යහන් කවි
(iii) සිරස පාද කවි (iv) යාග කවි

19. රජවරුන් හා දෙවියන් වර්ණනා කිරීම සඳහා නිර්මාණය වූ කවි,

(i) ජන කවි (ii) සිවුපද (iii) ටීකා සීපද (iv) ප්‍රශස්ති

20. එකැස් බෙරය හා පොකුරු බෙරය යනුවෙන් හඳුන්වන්නේ,

(i) දවුල හා තම්මැට්ටම (ii) රබාන හා තම්මැට්ටම
(iii) තම්මැට්ටම හා රබාන (iv) රබාන හා දවුල

21. උඩරට නර්තන සම්ප්‍රදායේ වට්ටම් ගණන,

(i) හයකි. (ii) පහකි. (iii) හතකි (iv) හතරකි

22. හින්දු බාලිකාවන් 500ක් දෙනා ගී ගයා නැටූහ. යනුවෙන් සඳහන් කරයි.

(i) ඉබන් බතූතාගේ වාර්තාවේ (ii) රොබට් නොක්ස්ගේ වාර්තාවේ
(iii) ස්පිල් බර්ජන්ගේ වාර්තාවේ (iv) පෙඩ්‍රික් ජේම්ස්ගේ වාර්තාවේ

23. ගම්පොළ යුගයේ දී ලියන ලද සංදේශ කාව්‍ය දෙකකි.

(i) සැළලිහිණි හා තිසර (ii) තිසර හා පරෙවි
(iii) මයුර හා තිසර (iv) ගිරා හා කෝකිල

24. ගද්‍ය හා පද්‍ය ලක්ෂණ මිශ්‍රව නිර්මාණය වූ ජනකවි විශේෂයකි.

(i) බඹර කවි (ii) ටීකා සිව්පද (iii) කරත්ත කවි (iv) පාරු කවි

25. කුදාංත ගත දොං වට්ටම නටන තාල රූපය වේ.

(i) මාත්‍රා 2+ 4 දෙතිත (ii) මාත්‍රා 3+ 3 තනිතිත
(iii) මාත්‍රා 3+ 4 දෙතිත (iv) මාත්‍රා 2+ 2 + 4 තුන්තිත

26. තත් තකට තකරොං, තක්කට තක්කට කුඳ තකරොං.................................. මෙම කොටස අයත් වන්නේ,

(i) මාත්‍රා 2+ 3 දෙතිතට නටන අඩව්වකට
(ii) මාත්‍රා 2+ 3 දෙතිතට නටන කස්තිරමකටය
(iii) මාත්‍රා 3+ 4 දෙතිතට නටන අඩව්වකටය
(iv) මාත්‍රා 3 + 4 දෙතිතට නටන කස්තිරමකටය

27. කොහොඹාකංකාරිය මුලින්ම පැවැත්වූයේ,

(i) සීනිගම දේවාලයේ (ii) අනුරාධපුර මහමෙව්නා උයනේ දී
(iii) ගාල්ල උණවටුනේදී (iv) දෙවිනුවර විෂ්ණු දේවාලයේ දී

28. උඩරට නර්තන සම්ප්‍රදායේ ගැමි නාටකයකි.

(i) කෝලම් (ii) රූකඩ (iii) නාඩගම් (iv) සොකරි

29. භරත නාට්‍යම් ප්‍රචලිත ප්‍රදේශ දෙකකි.

(i) මදුරාසිය සහ දිල්ලිය (ii) මදුරාසිය සහ ආන්ද්‍රා ප්‍රදේශ
(iii) මදුරාසිය සහ කේරලය (iv) මදුරාසිය සහ බංගලාදේශය

30. ''අරංගේත්‍රම්'' සංදර්ශනයක් යනු,

(i) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රථම කළඑළි දැක්ම
(ii) සරබගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රථම කළඑළි දැක්ම
(iii) භරත නර්තන සම්ප්‍රදායේ ප්‍රථම කළඑළි දැක්ම
(iv) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රථම කළඑළි දැක්ම

31. ''ග්‍රහ පන්ති'' කවි ගායනය කරන්නේ....................... බලි ශාන්ති කර්මවලදී,

(i) උඩරට සම්ප්‍රදායට අයත් (ii) පහතරට සම්ප්‍රදායට අයත්
(iii) සබරගමු සම්ප්‍රදායට අයත් (iv) සම්ප්‍රදායන් තුනටම අයත්

32. බලි ශාන්තිකර්ම වලදී බලි ඇඳුරා අතට ගන්නා සණ වාද්‍ය භාණ්ඩයකි.

(i) අත්මිණිය (ii) පන්තේරුව
(iii) තාලම්පට (iv) තලිය

33. හේවිසි වාදනයේදී යොදාගන්නා භාන්ඩ වර්ග තුනකි.

(i) තම්මැට්ටම, ගැටබෙරය, දවුල (ii) දවුල, තම්මැට්ටම, හොරණෑව

(iii) තම්මැට්ටම, හොරණෑව, තාලම්පොට (iv) දවුල, ගැටබෙරය, හොරණෑව

34. සමූහ නර්තන අංගයකදී අවධානය යොමුකළ යුතුය.

(i) පොදු අවකාශය හා රංග රටා නිර්මාණය කෙරෙහි.

(ii) පුද්ගල අවකාශය හා රංග රටා නිර්මාණය කෙරෙහි.

(iii) පුද්ගල අවකාශය හා දිසා භාවිතය කෙරෙහි.

(iv) පුද්ගල අවකාශය හා තල භාවිතය කෙරෙහි.

35. නාට්‍ය හා නර්තනයේදී අභිනය කොටස්,

(i) පහකි. (ii) තුනකි. (iii) හතරකි. (iv) හයකි.

36. නර්තනය ආරම්භ කිරීමට පෙර නමස්කාරය කිරීම හා ගුරුවරයාට වැඳීම.

(i) අනිවාර්ය නීතියකි (ii) හොඳ ගුණාංගයකි.

(iii) නර්තන කලාව හා බැඳි සාරධර්මයකි (iv) අනුන් කරන නිසා කළ යුත්තකි.

37. කුවේණියගේ විලාපය දැක්වීම සඳහා කොහොඹා කංකාරි ශාන්තිකර්මයේදී නටන නර්තන අංගයකි.

(i) දුනුමාලප්පුව (ii) අ[illegible]ත් (iii) යක්කැත්තුම (iv) බූලත් පදය

38. පහතරට නර්තන සම්ප්‍රදායේ වෙස් මුහුණු කැපීම සඳහා යොදා ගන්නා ලී වර්ග දෙකකි.

(i) රුක්අත්තන සහ වෙල්කදුරු (ii) කැන්ද සහ වෙල්කදුරු

(iii) පුළුන් සහ රුක්අත්තන (iv) රුක් අත්තන සහ බුරුත

39. මුදලි, හෙන්චා, ලේනච්නා.............. මෙම චරිත දැකිය හැකිය.

(i) හේවා කෝලමේ (ii) පොලිස් කෝලමේ

(iii) ජස කෝලමේ (iv) අණබෙර කෝලමේ

40. කෝලම් නාටක සඳහා වාදනය කරයි.

(i) පහතරට බෙරය සහ දවුල (ii) පහතරට බෙරය සහ හොරණෑව

(iii) ගැටබෙරය සහ දවුල (iv) ගැටබෙරය සහ හොරණෑව

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 3 කට පිළිතුරු ලියන්න.**

1. (i) බලි ශාන්තිකර්ම වලදී බලි ඇදුරා අතට ගන්නා උපකරණය ..........................................................

නමින් හඳුන්වයි. ...................................... ගැමි නාටකය උඩරට නර්තන සම්ප්‍රදායට අයත්ය.

(ii) දෙවුන්දර දේවාලයේ නැටුම් පැවැත්වූ බව ...................................... ගේ වාර්තාවේ සඳහන වේ.

(iii) අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු .............................. .............................. හා ...................................................... ලෙන්ලිපි දෙකෙහි සඳහන් වේ.

(iv) දක්ෂිණ භාරතයේ ප්‍රචලිත ...................................... සඳහා .............................. සංගීත සම්ප්‍රදාය භාවිතා කරයි.

(v) .............................. හා .............................................. ශෛලිගත නාට්‍ය වලට උදාහරණ දෙකකි.

(vi) ......................................................දුවිඩ ගැමි නැටුම ලී කෙලි නැටුමට සමාන වේ.

2. නැටුම් පිළිබඳ ඓතිහාසික තොරතුරු සෙවීමේ දී දේශායන වාර්තාවලින් වැදගත් කරුණු හෙළි කරයි.

(i) දේශාඨන වාර්තා ලියවුණු යුග සහ එම වාර්තා ලියූ දේශ සංචාරකයින්ගේ නම් සඳහන් කරන්න.

(ii) එසේ ලියන ලද එක් වාර්තාවක් ලියා දක්වන්න.

3. නයියඩි වන්නමේ බෙර පදය, තානම හා එක් කවියක් ප්‍රස්තාර කරන්න.

4. පහත සඳහන් මාතෘකා තුනක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) සතර අභිනය (ii) වන්නම් (iii) අවකාශ භාවිතය

(iv) මණ්ඩිය (v) ගැමි නැටුම්

5. (i) ග්‍රහ පන්ති කවි කෙටියෙන් හඳුන්වන්න.

(ii) ග්‍රහ පන්ති කවියක් ලියන්න.

(iii) කඩතුරා කවියක් ලියන්න.

6. (i) අනාසාතාත්මක හා ආසාතාත්මක කෙටි හැඳින්වීමක් කරන්න.

(ii) ටීකා සීපදයක දක්නට ලැබෙන විශේෂතා ලියා දක්වන්න.

7. නර්තන කලාව හා සම්බන්ධ සාරධර්ම පිළිබඳ හැඳින්වීමක් කරන්න.